ආයතනයේ නම : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු
අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : அரசாங்க அச்சகத் திணைக்களம்

பாராளுமன்ற அரசாங்க கணக்குக் குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கை
தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119 (4) கீழ்
கௌரவ அமைச்சரின் அவதானிப்பு மற்றும் எடுக்கப்பட்ட
நடவடிக்கைகள் பாராளுமன்றத்திற்கு முன்வைத்தல்.

Name of the Institution : Department of Government Printing

Submission of observations of Hon Minister and Steps Taken with Regard To the Reports Tabled by The Committee on Public Account in Terms of Standing Ordrer No 119(4)

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 183

ආයතනය - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හා වත්මන් තත්ත්වය
පළමු කොටස - 86:00	
i වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	මෙම දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ එලෙස ගර්හිත වී අපහරණය කළ යුතු වාහන 05ක් පැවති අතර, එම වාහන නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් අපහරණය කිරීමට කටයුතු කර ඇත. ඉන් එක් වාහනයක් ඒ සඳහා වැඩිම මිල ඉදිරිපත් කරන ලද ගැනුම්කරු විසින් මිලදී ගැනීම පසුව ප්‍රතික්ශේප කිරීම හේතුවෙන් එම අවස්ථාවේදී විකිණීමට නොහැකි විය. ඒ සම්බන්ධයෙන් නැවත මිල ගණන් කැඳවිය යුතු බවට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයෙන් ලද නිර්දේශ මත මේ වන විට අදාළ තාක්ෂණික නිර්දේශ ලබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇත.
ii 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව අවසන් වරට සිදුකර ඇත්තේ 2019.06.14 දිනය. ඉන් අනතුරුව කොවිඩ් - 19 රෝග ව්‍යාප්තිය සහ ඉන්ධන අර්බුධය වැනි තත්ත්වයන් මත රටතුළ උද්ගතවූ අර්බුධකාරී වාතාවරණය හේතුවෙන් මේ දක්වා නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට නොහැකි විය. වර්තමාන ඉන්ධන සීමා කිරීම් නිසාද, කේත ක්‍රමයට ඉන්ධන කෝටාවක් පමණක් ලබාදෙන බැවින්ද ඉන්ධන දහන පර්ක්ෂාව කල් තැබීමට සිදුවී ඇත. නමුත්, ඉදිරියේදී දෙපාර්තමේන්තු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් නිසි කලට සිදු කිරීමට සියලුම නිලධරයින් දැනුවත් කරන ලදී.
iii මු.රෙ.94(1)ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	2020 අගෝස්තු මස පැවැත්වූ මහා මැතිවරණයට අදාල සියළු මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මඟින් සිදුකර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් මිලදී ගැනීම් හේතුවෙන් මෙම බැඳීම් ඇති වී ඇත.
iv වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ණය අයකර ගැනීම පිළිබඳ වාර්තාව ඇමුණුම 01 හි දැක්වේ.

v	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2020 වර්ෂයට අදාල වසර 02 ඉක්මවූ තැන්පතු වල සම්පූර්ණ විවිනාකම් මේ වන විට නිරවුල් කර ඇත.

2022.12.31 දිනට තැන්පත් ගිණුම් කාල විශ්ලේෂණය

පොදු තැන්පත් ගිණුමේ නම	භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ අංකය	අවු - 01 ට අඩු	අවු 01-02 අතර	අවු 02-05 අතර	2022.12.31 දිනට ශේෂය
වෙන්ඩර් තැන්පතු ගිණුම	6000-0-02-0-50	6,483,000.00	1,615,000.00	-	8,098,000.00
වාණිජ මුද්‍රණ තැන්පතු ගිණුම	6000-0-0-13-0-35	42,909,252.18	53,362,380.59	-	96,271,632.77
ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් කාවකාලික රඳවා ගැනීම්	6000-0-0-18-0-03	104,275.00	326,031.18	-	430,306.18

vi	කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන්, අංශ ප්‍රධානීන් හා විෂය නිලධාරීන් සඳහා කාර්ය පැවරුම් සිදුකර ඇත. කවද, දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල සේවයේ නියුතු නියුතු නිෂ්පාදන අනුයුක්ත ඇතැම් කාණ්ඩවල/ සේවාවල නිලධාරීන් සඳහා අංශ ප්‍රධානීන් මඟින් කාර්ය පැවරුම් නිකුත් කර ඇති නමුත් ඇතැම් නිලධාරීන් විසින් වර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් හේතුවෙන් රාජකාරි පැවරුම් සිදු කිරීමට අකපඅු වූ අවස්ථා පවතී. නමුත්, මේ වන විට අංශ භාර මාණ්ඩලික නිලධාරීන් හා අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර විධිමත් ක්‍රමවේදයක් තුළ රාජකාරි පැවරීම් සිදු කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

දෙවන කොටස - 57:00		
i	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම මෙයෙන් 2008.02.06 දිනැතිව නිකුත් කළ අංක 05/2008 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සකස් කරන ලද පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අත්පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, ඊට අමතරව විමසීම් අංශයේ ප්‍රදර්ශනය කිරීමට නියමිතය. ඒ අනුව, 2023 වර්ෂයේදී චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට අවශ්‍ය සියලු කටයුතු යොදා ඇත.
ii	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	

iii	රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2020 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම රා.පරි.වක්‍රලේඛ 02/2018 අනුව සකස් කර නොමැත. එහෙත් 2020 වර්ෂයට පුහුණු සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර ඇත. එසේම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට එම පුහුණු සැලැස්මට ඇතුළත් කර රේඛීය අමාත්‍යාංශය වෙතද යොමු කර ඇති අතර එම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් වූ පරිදි පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
iv	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් ඒක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ 1300කට ආසන්න කාර්ය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටින අතර වර්ෂයක් තුළ එකී සමස්ථ කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය කර ගැනීම සඳහා ප්‍රතිපාදන සීමා සහිත වීම, තාක්ෂණික පුහුණු පාඨමාලා සඳහා වැඩි ප්‍රමුඛතාවය ලබා දීමට සිදුවීම(එවැනි පුහුණු පාඨමාලා සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ.) ආදී හේතු මත සමස්ථ කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි එක් වර්ෂයකදී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපහසු අතර සෑම විටම සේවා අවශ්‍යතාවය මත පුහුණු ලබා දීමට කටයුතු කර ඇත.
v	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මෙම ආයතනයේ 2022.12.31 දිනට කාර්ය මණ්ඩලය 1215 ක් වන අතර, ඔවුන් සියලු දෙනා සඳහාම මේ දක්වා 185 පොදු ආකෘතිය ප්‍රකාරව කාර්ය සාධන වාර්තා අත්සන් කර ඇති අතර තවදුරටත් කරනු ලබයි. එයට අමතර වශයෙන් රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ 02/2018 ප්‍රකාරව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සඳහා ද දැනුවත් කර ඇත. නමුත්, මෙම ආයතනයේ බහුතරයක් සේවකයින් ප්‍රාථමික හා ද්විතීක තාක්ෂණ ගණයට අයත් සේවකයන් වන අතර ඔවුන්ට මෙම කාර්ය සාධන ගිවිසුම් සම්පූර්ණ කිරීම සම්බන්ධව ප්‍රමාණවත් අවබෝධයක් නොමැත. එමෙන්ම 1215 ක් වැනි විශාල සේවක ප්‍රමාණයක් සඳහා කාර්ය සාධන ගිවිසුම් වාර්ෂිකව සකස් කිරීම ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය වන බැවින් (වර්ෂයකට කාර්ය සාධන වාර්තා 02 ක් අත්සන් කිරීම, කඩදාසි භාවිතය ඉහළ යාම, ප්‍රාථමික, ද්විතීයික මට්ටම්වල සේවකයන්ට සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් අවබෝධයක් නොවීම ආදී හේතු මත) ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලබා ගැනීමට දැනට කටයුතු කරමින් පවතී. මාණ්ඩලික නිලධාරීන් හා අංශ ප්‍රධානීන් සඳහා 02/2018 වක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු යොදා ඇත.
vi	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට අඩු මට්ටමක පැවතුණි.	2020 වර්ෂයේදී පුහුණු සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ ආයතනයේ පාලනයෙන් බැහැර හේතුවක් වූ Covid - 19 වසංගත තත්ත්වය ව්‍යාප්තවීම හේතුවෙනි. 2020 මාර්තු 16 සිට 2020 දෙසැම්බර් 31 දක්වාම රාජ්‍ය සේවයේ සියලු කටයුතු, නිරෝධාන ඇඳිරි නීතිය, සංචරන සීමා සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් සීමා විය. ඇතැම් අවස්ථාවලදී රාජ්‍ය ආයතන රාජකාරී සඳහා සම්පූර්ණ වශයෙන්ම වසා තැබූ අතර ඇතැම් කාල වලදී අත්‍යවශ්‍ය රාජකාරී සඳහා පමණක් සීමා විය. එමෙන්ම පුද්ගල ඒකරාශීවීම් වලින් සම්පූර්ණ වැළකී සිටිය යුතු විය. මෙම තත්ත්වය තුළදී අපේක්ෂා කළ පරිදි පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම ආයතනයේ පාලනයෙන් බැහැර හේතුවක් විය. 2021 වර්ෂයේදී ද උක්ත තත්ත්වය පැවති නමුත් 2022, 2023 වර්ෂයන්හි දී කාර්ය මණ්ඩලයේ බහුතරයක් නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කර ඇත.

vii	විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	මේ වන විට විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.
viii	හඳුනාගත් පළමු කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයක් විය.	මෙහි පළමු කාර්ය සාධන දර්ශකය ලෙස හැඳින්වෙන්නේ මානව සම්පත් සංවර්ධනයයි. එයට බඳවා ගැනීම්, කාර්යක්ෂමතා කඩඉම් සහ ප්‍රතිඵල වැඩසටහන් ඇතුළත් විය. නමුත්, 2020 වර්ෂයේදී මානව සම්පත් සංවර්ධන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූයේ, ආයතනයේ පාලනයෙන් බැහැර හේතුවක් වූ Covid-19 තත්ත්වය ව්‍යාප්තවීම හේතුවෙනි. 2020 මාර්තු 16 සිට 2020 දෙසැම්බර් 31 දක්වා රාජ්‍ය සේවයේ සියලු කටයුතු නිරෝධායන ඇඳිරි නීතිය, සංචරණ සීමා සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් සීමා විය. ඇතැම් අවස්ථාවලදී රාජ්‍ය ආයතන රාජකාරී සඳහා සම්පූර්ණ වශයෙන් වසා තැබූ අතර, ඇතැම් කාලවලදී අත්‍යවශ්‍ය රාජකාරී සඳහා පමණක් සීමා විය. එමෙන්ම සුද්ගල ඒකරාශිවීම් වලින් සම්පූර්ණයෙන් වැළකී සිටිය යුතු විය. මෙම තත්ත්වය තුළදී අපේක්ෂා කළ පරිදි ප්‍රතිඵල කටයුතු විභාග පැවැත්වීම් හා බඳවා ගැනීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම ආයතනයේ පාලනයෙන් බැහැර හේතුවක් වූ බව කාරුණිකව සඳහන් කරමි.2021 වර්ෂයේදී ද උක්ත තත්ත්වය පැවතිණි. නමුත්, 2022 හා 2023 වර්ෂයන්හි දී කාර්ය මණ්ඩලයේ බහුතරයක් නියෝජනය වන පරිදි ප්‍රතිඵල වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධරයන් හට 2022 වර්ෂයේදී සැලසුම් කරන ලද ප්‍රතිඵල අවස්ථාවන් සඳහා යොමු කරවීමට අවස්ථාව ලැබුණි. තවද, සේවා අවශ්‍යතාවය මත ප්‍රතිඵලතාවය ලබාදීමට කටයුතු කර ඇති අතර, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බොහෝ පිරිසක් එම ප්‍රතිඵල පාඨමාලාවන් වෙත මේ වන විට යොමු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. නමුත් රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයට අනුව නිකුත් කළ අංක 03/2022 දරන 2022.04.26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කර ගැනීම සම්බන්ධ ජාතික අයවැය වක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීමට සිදුව ඇත. තවද, කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ අත්‍යවශ්‍ය පැහැදිලි කිරීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ලබාගෙන සියලුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2023 වර්ෂයේ මුල් කාර්තුවේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි. ඇතැම් කාර්යක්ෂමතා කඩඉම් පවත්වා අවසන් කර ඇත. 2022 වර්ෂයේ ප්‍රගතිය ඇමුණුම 02 පරිදි වේ.

- වසර 01 කට වඩා වැඩි කාලයක් පැවතෙන හිඟ ණය ගොනු පිළිබඳ වාර්තාව

අනු අංක	නිලධරයාගේ නම, අදාල ණය/අත්තිකාරම් වර්ගය හා අය විය යුතු හිඟ ණය මුදල	ණය හිඟව පැවතීමට හේතු හා ගෙන ඇති ක්‍රියා මාර්ග
01	එම්. සිරිසේන මයා ආපදා ණය - රු. 110,440.00	මෙම නිලධරයා අංක ආ12/10173ඒ/2018 දරන 2018/02/23 දිනැති ලිපිය මඟින් 2017/11/28 දින විශ්‍රාම ගන්වා ඇත. මොහු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචිය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම ප්‍රමාද වීම මත එම තොරතුරු වි.වැ. අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම ප්‍රමාද විය. පසුව වි.වැ.අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කල ද, ඔහුගේ අඩු පාඩු මත ලිපි ගොනුව නැවත හරවා එවා ඇත. නැවතත් මෙම ගොනු පිළිබඳ අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.
02	ජී.එස්.එස්.අතුකෝරල මයා ආපදා ණය - රු. 137,880.00	මෙම දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සංස්කාරක තනතුරක සේවය කර 2016/04/24 දින විශ්‍රාම ගොස් ඇත. මෙම නිලධාරියා විශ්‍රාම වැටුප් සකස් කිරීමට අදාල ලේඛන මෙතෙක් ඉදිරිපත් නොකිරීම මත විශ්‍රාම වැටුප සහ විශ්‍රාම පරිතෝෂිකය සැකසීමට නොහැකිව ඇත. විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාල ලිපි ලේඛන නොපමාව ඉදිරිපත් කරන ලෙස හා හිඟ ණය මුදල ගෙවා නිම කරන ලෙස 2018/02/21 2019/06/06, 2020/09/23 හා 2022/04/25 දිනැති ලිපි මඟින් දැනුවත් කර ඇත. නමුදු මේ දක්වා නිලධරයාගෙන් පිළිතුරු නොලද බැවින් හිඟ ණය මුදල ගෙවා නිම කරන ලෙසත් එසේ නොමැති වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන බවත් දන්වා ලිපි යොමු කර ඇතත්, මේ දක්වා ප්‍රතිචාර නොලද බැවින් ඉදිරියේ දී නීතිපති උපදෙස් සඳහා යොමු කිරීමට බලාපොරොත්තු වේ.
03	එච්.ඩී.එස්.ජයරත්න මයා ආපදා ණය - රු. 152,320.00 උත්සව අත්තිකාරම් - රු. 2,000.00 විශේෂ අත්තිකාරම් - රු. 250.00 රු. 154,570.00	මෙම දෙපාර්තමේන්තුවේ ශුද්ධිපත්‍ර බලන්නා තනතුරක සේවය කරන ලද එච්.ඩී.එස්. ජයරත්න මහතා 2013/10/28 දින විශ්‍රාම ගන්වා ඇත. තනතුරට අදාල මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබීමේ හේතුව මත ඔහු විශ්‍රාම ගන්වා ඇති අතර, ඒ අනුව ඔහු විශ්‍රාම වැටුප් හිමිකම සඳහාද සුදුසුකම් නොලබන බව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/6/106/2017 දරන 2018/10/18 දිනැති ලිපියෙන් දන්වා ඇත. මේ හේතුවෙන් රජයට අයවිය යුතු හිඟ ණය මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. අදාල ණය මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස කිහිප අවස්ථාවකදීම ණයකරු දැනුවත් කර ඇතත් ඊට ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් මෙම ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අංක ආ15/873/හි.ණ.අ/2019 දරන 2021/02/23 දිනැති ලිපිය නීතිපති වෙත යොමු කර ඇති අතර, ඊට අදාළ නීතිමය කටයුතු සිදුකරමින් පවතින බව සි/52/2021 දරන 2021/03/04 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.
04	එම්.ටී. නිරෝධ ආපදා ණය - රු. 90,300.00 විශේෂ අත්තිකාරම් - රු. 1,500.00 රු. 91,800.00	මෙම ණයකරුට නීතිපති දෙපාර්තමේන්තුව විසින් එන්තර වාසියක් යවා ඇත. නමුත් ඔහු මේ දක්වා ඊට ප්‍රතිචාර දක්වා නොමැත. ඒ පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිඛිත දැනුම් දීමක් සිදුකර ඇති අතර, මෙම වන විට නීතිමය ක්‍රියා මාර්ග සිදු කරමින් පවතී.

05	කේ.කේ. අනිල් ආපදා ණය - රු. 822.72	මෙම නිලධරයාගේ හිඟ ණය රු 57,100/= ක මුදලක් පැවති අතර, නීතිපති දෙපාර්තමේන්තුව මගින් නඩු පැවරීම ප්‍රතික්ෂේප කර ඇත. පසුව දෙපාර්තමේන්තු මැදිහත් වීම මත නිලධරයා දැනුවත් කර මාසික වාරික ගෙවීමේ ක්‍රමවේදයක් සකසා දීමෙන් පසුව ඔහු වාරික වශයෙන් ගෙවීම සිදු කරන ලද අතර, 2022/11 මස වන විට මූලික මුදලම ගෙවා අවසන් කර ඇත.
06	එස්.ඒ. රත්නසාර ආපදා ණය - රු. 94,660.00	කොළඹ දිසා අධිකරණයේ DMR 01432/2019 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අවශ්‍ය සියලු ලේඛනවල මුල් පිටපත් නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත.
07	එම්.පී.ඩබ්. පීරිස් ආපදා ණය - රු. 39,245.00 දේපළ ණය - රු. 271,720.00 රු. 310,965.00	කොළඹ දිසා අධිකරණයේ DMR 2631/2016 යටතේ නඩුව විභාග වී අවසන්ය. අවසාන නඩු තීන්දුව ලබා දුන් 2018 අගෝස්තු මස 28 දිනය සැලකිල්ලට ගෙන මුළු හිඟ මුදල හා ඊට අදාළ පොළිය ද සමඟ සෑම මසකම 28 දින රු. 10,000/= බැගින් වාරික 55 කින් හා ඉතිරි රු. 10,938.85 ගෙවීමට අධිකරණ තීන්දුව ලබා දී ඇත. දැනට වාරික කිහිපයක් පමණක් ගෙවීම සිදුකර ඇත. හිඟ ණය මුදල ගෙවන ලෙස ණයකරු කිහිපවරක්ම දැනුවත් කර ඇති අතර, ඒ අනුව අවස්ථා දෙකකදී පොලී මුදල පමණක් ගෙවීම සිදු කර ඇත. අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී.
08	ඩබ්.එම්.ඩී.ඩී.සංජීව ආපදා ණය - රු. 121,400.00 උත්සව අත්තිකාරම් - රු. 8,750.00 විශේෂ අත්තිකාරම් - රු. 800.00 රු. 130,950.00	කොළඹ දිසා අධිකරණයේ DMR 2601/2020 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අවශ්‍ය සියලු ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත.
09	එස්.ඩී.ඩබ්. අමරසිංහ ආපදා ණය - රු. 118,800.00	කොළඹ දිසා අධිකරණයේ DMR 1866/2019 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, නඩුව සඳහා අවශ්‍ය සියලු ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත.
10	ඒ.ඒ.ජේ.කේ.අමරසිංහ ආපදා ණය - රු. 187,660.00	කොළඹ දිසා අධිකරණයේ DMR 1215/2019 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, චිත්තිකරුට සිතාසි ඉදිරිපත් කර ඇත. ඉදිරි නඩු දිනය මෙතෙක් දන්වා නොමැත.
11	පී.එච්.එස්. විජේසිංහ ආපදා ණය - රු. 115,720.00 උත්සව අත්තිකාරම් - රු. 3,500.00 විශේෂ අත්තිකාරම් - රු. 1,250.00 රු. 120,470.00	කොළඹ දිසා අධිකරණයේ DMR 5167/18 යටතේ නඩුව විභාග වෙමින් පවතී. නඩුව සඳහා අවශ්‍ය සියලු ලේඛන යොමු කරන ලද අතර, නීතිපති දෙපාර්තමේන්තුව විසින් චිත්තිකරුට සිතාසි යවා ඇත. ඉදිරි නඩු දිනය මෙතෙක් දන්වා නොමැත.

12	කේ.පී. සුමිත් ආපදා ණය - රු. 125,960.00 උත්සව අත්. - රු. 1,000.00 දේපල ණය -රු. 229,700.00 රු. 356,660.00	නිලධරයා මියගොස් ඇති බැවින් බිරිඳට විරුද්ධව නඩු පැවරීම නීතිපති දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කර ඇත. නිලධරයාගේ බිරිඳට වැන්දඹු අනත්දරු දායක මුදල සකසා දීම මගින් හෝ මෙම හිඟ මුදල අයකර ගැනීමට උත්සහ දරමින් පවතී. දැනට ඇයගේ ස්ථිර ලිපිනය සොයා ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින අතර, ලිපිනය සොයා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.
13	ඒ.සී. වික්‍රමසිංහ ආපදා ණය - රු. 152,790.00 උත්සව අත්. -රු. 2,400.00 විශේෂ අත්. - රු. 2,250.00 රු.157,440.00	කෙටුම්පත් පැමිණිල්ලේ නිවැරදිතාවය තහවුරු කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. නඩු අංකයක් ලබා දී නොමැති අතර, ඉදිරි නඩු දිනය පිළිබඳ නීතිපති උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.
14	කේ.ඩී.ඒ.ලාල් ආපදා ණය -රු. 55,175.00 උත්සව අත්. - රු. 1,800.00 රු. 56,975.00	අවිස්සාවේල්ල දිසා අධිකරණයේ 28786/එම් යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අවශ්‍ය සියලු ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත. මෙම නිලධරයා මියගොස් ඇති අතර, බිරිඳට වැන්දඹු අනත්දරු දායක මුදල සකසා දී, ඉදිරියේදී එම මුදල ඇයගේ කැමැත්ත මත අයකර ගැනීමට අපේක්ෂා කෙරේ.
15	බී.ඒ.පී.පෙරේරා ආපදා ණය - රු. 32,290.00	2004/01/12 වන දින තනතුර අතහැර ගොස් ඇති අතර ජන්ද හිමි නාම ලේඛනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එම ලිපිනයට යවන ලද ලියාපදිංචි ලිපි නැවත හරවා එවා ඇත.මෙම නිලධරයා පිළිබඳ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තොරතුරු ලිපියකින් විමසීමක් කර ඇති අතර, පිළිතුරු ලද වහාම ණය අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.
16	එස්.ඒ.එස්.එස්.පෙරේරා ආපදා ණය - රු.32,220.00	මෙම නිලධරයාගේ ලිපිනය සොයා ගත නොහැකිව පැවති අතර, ජන්ද හිමි නාම ලේඛනය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලිපිනය සොයා ගන්නා ලදී. ඒ අනුව හිඟ ණය ගෙවන ලෙස දන්වා 2020/07/08 හා 2020/09/23 දිනැතිව ලිපි යොමු කළ ද ණයකරු ප්‍රතිචාර නොදක්වා ඇත. තවදුරටත් අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.
17	ඩී.ඩී. පී.සී. සිරිනායක ආපදා ණය -රු. 37,180.00 උත්සව අත්.- රු. 1,800.00 විශේෂ අත්. - රු. 300.00 රු.39,280.00	මාතර දිසා අධිකරණයේ දී එම්/15994 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, නඩුව සඳහා අවශ්‍ය සියලු ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත.
18	එල්.ඒ. විජිතානන්ද ආපදා ණය -රු. 45,530.00	ජන්ද හිමි නාම ලේඛනයේ ලිපිනයට අනුව 2020/07/08 දින ලිපියක් යොමු කළ ද එම ලිපිය නැවත හරවා එවා ඇති අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලිපිනය තහවුරු කර ගැනීමට කටයුතු යොදමින් පවතී.
19	කේ. සිදම්බරේෂන් ආපදා ණය - රු. 60,410.00 උත්සව අත්. - රු. 1,800.00 දේපල ණය - රු. 323,870.00 ඇපකරුණය.- රු. 11,730.00 රු.397,810.00	කොළඹ දිසා අධිකරණයේ නඩුව විභාග වෙමින් පැවතින අතර, දේපල ඔප්පුවේ මුල් පිටපත ගාස්තු රහිතව ලියාපදිංචි කර දීම සඳහා එහි පිටපතක් මහර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට යොමු කර ඇත.

20	එස්.ඩී.එන්. කුලරත්න ආපදා ණය - රු. 86,335.00 උත්සව අත්. -රු. 800.00 දේපළ ණය - රු .40,350.00 විශේෂ අත්. - රු. 800.00 රු. 128,285.00	මෙම නිලධරයා මිය ගොස් ඇති අතර, ඔහුගේ බිරිඳ වැන්දඹු අනත්දරු වැටුප ද නිමිකම් නොලබන බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. නමුත් නැවත ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී තනතුර ස්ථිර කරන ලද වසර 2 ක සේවා කාලය සඳහා වැන්දඹු අනත්දරු දායක මුදල ගෙවීමට කැමත්ත ප්‍රකාශිත ලිපියක් ලබා දෙන ලෙස දුරකථනය ඔස්සේ කලත්‍රයා දැනුවත් කර ඇත. එම ලිපිය ලැබීමෙන් අනතුරුව නැවතත් විශ්‍රාම වැටුප් දෙපා. යොමු කොට වැන්දඹු අනත්දරු වැටුප සාදා දීමට අපේක්ෂා කෙරේ. ඒ මගින් මෙම හිඟ මුදල අයකර ගැනීමට අපේක්ෂා කෙරේ.
21	ජේ.ජී.එච්.ඩබ්.කුමාර ආපදා ණය -රු. 59,850.00	රජයේ මුද්‍රණාලයාධිපතිගේ අංක GP/E/L/1/2015 හා 2020/09/30 දිනැතිව අත්හැර දැමීම සඳහා යොමු කළ ද, රාජ්‍ය මුදල් දෙපා. ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. මෙම හිඟ ණය අයකර ගත හැකි ආකාරය පිළිබඳ නැවතත් සළකා බැලීමක් සිදු කරමින් පවතී.
22	බී.පී.ගුණරත්න ආපදා ණය - රු. 25,440.00 උත්සව අත්. - රු. 900.00 දේපල ණය - රු.117,620.00 රු. 143,960.00	කොළඹ දිසා අධිකරණයේ DMR 2624/2016 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අවශ්‍ය සියලු ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇත.
23	කේ.ඒ. අල්විස් ඇපකරු ණය -රු. 20,970.00	රේඛීය අමාත්‍යාංශයේ අංක MMI/AD02/02/04-29 දරන 2021/12/20 දිනැති ලිපිය මඟින් මෙම හිඟ ණය මුදල අත්හැර දැමීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර, 2023 ජනවාරි මස වන විට අත්හැර දැමීම සිදු කර ඇත.
24	බී.ජී.එස්.පී.ගුණතිලක ආපදා ණය - රු. 96,590.00 උත්සව අත්. - රු. 1,500.00 රු. 98,090.00	කොළඹ දිසා අධිකරණයේ DMR 3877/19 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අවශ්‍ය සියලු ලේඛන වල මුල් පිටපත් 2021/03/26 දින නීතිපති දෙපාර්තමේන්තුවට බාර දී ඇති අතර, නීතිමය කටයුතු සිදු කරමින් පවතී.
25	එම්.ආර්.එම්.රණාඩ ආපදා ණය - රු. 40,430.00 විශේෂ අත් - රු. 100.00 රු.40,530.00	අවශ්‍ය ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ලිපි හුවමාරුව අංක සී/100/2017 යටතේ සිදුවේ. ණයකරුගේ ස්ථිර ලිපිනය කැලණිය ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාලය හරහා සනාථ කර, ඒ පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.
26	බී.එල්.පී.කුමාර ආපදා ණය -රු. 25,260.00	ජන්ද හිමි නාම ලේඛනයේ ලිපිනයට අනුව 2020/07/08 දින ලිපියක් යොමු කළ ද එම ලිපිය නැවත හරවා එවා ඇති අතර, දැනට පදිංචි ලිපිනය සොයා ගැනීමට කටයුතු කරමින් පවතී.

අනු අංකය	ක්‍රියාකාරකම් විස්තරය	වාර්ෂික ඇස්තමේන්තුව		කාර්තුව අවසානයේ	
		මූල්‍ය (රු.මි)	භෞතික	මූල්‍ය (රු.මි)	භෞතික
01.Trainings					
1	Tamil/ Sinhala Language Training Programme	0.3	100%	0.015	70%
2	Training Courses for Group of Office Staff	0.1	100%	-	-
3	Postgraduate Programme for the Executive Officers	0.9	100%	0.554	80%
4	Leadership Training Programme	0.1	100%	-	-
5	Vocational Training Courses for Group of Office Staff in the Sri Lanka Institute of Printing	0.5	100%	0.416	90%
6	Security Training Programme for the Security Officer	0.1	100%	-	-
7	Tamil/ Sinhala Language Training Programme	-	100%	0.225	70%
8	Postgraduate Programme for the Executive Officers	0.75	100%	0.15	50%
9	Vocational Training Courses for Printing Service	1.25	100%	1.036	60%
10	Printing Training Courses for Printing Service in Sri Lanka Institute of Printing on Scholarship	-	100%	-	-
	එකතුව	4	100%	2.396	42%

- වෘත්තිය පුහුණු පාඨමාලාවන් හි සාමාන්‍ය කාලය මාස 06 ක් හෝ ඉන් ඉහළ වන බැවින් වර්ෂයේ මැද කාලයේ දී ආරම්භ වූ විට එය අවසන් වන්නේ ඊළඟ වසරේ මුල් කාලයේ දි වන බැවින් මෙහි ප්‍රගතිය සාමාන්‍ය වශයෙන් 50% ක් වැනි අගයක් ගනී.

02. Recruitments					
අනු අංකය	ක්‍රියාකාරකම් විස්තරය	වාර්ෂික ඇස්තමේන්තුව		කාර්තුව අවසානයේ	
		මූල්‍ය (රු.මි)	භෞතික	මූල්‍ය (රු.මි)	භෞතික
1	Recruitment of Senior Executive & Executive Grade	1.5	100%	-	-
2	Recruitment of Supervisory Management Assistant (Technology)- MN3 Tech Head Forman, Head Printing Editor, Forman, Assistant Head Printing Editor	0.028	100%	0.03816	60%
3	Recruitment of Management Assistant (Technical) MT-1 Tech Computer Type Setter & Designer Printing Editor, Pre-Press Planner Offset Litho Print Operator Letter Press Operator Print Finisher Printing Technician	0.05	100%	-	-
4	Recruitment of Management Assistant Non- Technical Warehouseman	0.005	100%	-	-

5	Recruitment of Primary Level Skilled Service Motor Mechanic Fitter Electrician	0.05	100%	-	-
6	Recruitment of Primary Level Semi Skilled Service Counter & Packer Checker Forklift & Lister Carpenter Security Guard Plumber	0.05	100%	0.02608	80%
7	Recruitment of Printing Work Aid 51 Vacancies	0.015	100%	-	-
එකතුව		1.698	100%	0.06424	20%

- අංක BD/CBP/01/01/04-2022 දරන 2022.04.26 දිනැති 03/2022 ජාතික අයවැය චක්‍රලේඛ අනු අංක VII ප්‍රකාරව 2022 වර්ෂයේ සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණ ද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තබන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව 2022.04.26 දින සිට බඳවා ගැනීම්/ උසස් කිරීම් (ශ්‍රේණි උසස් කිරීම් නොව) සිදු කිරීමට නොහැකි වී ඇත.

03.Efficiency Bar Examinations

අනු අංකය	ක්‍රියාකාරකම් විස්තරය	වාර්ෂික ඇස්තමේන්තුව		කාර්තුව අවසානයේ	
		මූල්‍ය (රු.මි)	භෞතික	මූල්‍ය (රු.මි)	භෞතික
1	Efficiency Bar Examinations for the Officers of OES & Drivers Service	0.05	100%	-	-
2	Efficiency Bar Examination for Printing/ Departmental Service	0.05	100%	-	10%
	MN 3 – I/ II/ III				
	MN 1 – I/II/ III				
	MT 1/ 3 – I/ II/ III			-	20%
	PL 2 – I/ II/ III			-	-
	PL 3 – I/ II/ III			-	50%
	PL 1 – I/ II/ III			0.00758	50%
	All EB's Twice for the Year			-	50%
එකතුව		0.1	100%	0.00758	26%

- 2022 වර්ෂය තුළ කාණ්ඩ 07 ක් යටතේ කාර්යක්ෂමතා කඩඉම් වසරේ දෙවතාවක් පැවැත් වීමට කටයුතු සැලසුම් කර තිබුණි. රට තුළ පැවති සංචරණ සීමා හා ඉන්ධන අර්බුදය හේතුවෙන් නිවසේ සිට රාජකාරී ඉටු කිරීමට අවස්ථාව ලබා දීම වැනි තත්ත්වයන් තුළ කාර්යක්ෂමතා කඩඉම පැවැත්වීම සීමා සහිත වූ බැවින් PL 1,2 හා 3 අදාළව වර්ෂයට එක් වරක් පැවැත් වූ අතර අනෙකුත් කාර්යක්ෂමතා කඩඉම් සඳහා අයදුම්පත් කැඳවා ඉදිරි කටයුතු සිදු කර ඇත.

- තව ද, මෙම බොහෝමයක් කාර්ය මණ්ඩලය තාක්ෂණික සේවා ගණයන් හි වන හෙයින් ඔවුන්ට සාමාන්‍ය පරිපාලන, ආයතන හා කළමණාකරනය වැනි විෂයයන් වෙනුවෙන් දැනුවත් කිරීම් සිදු කරන ලෙස ඉල්ලීම් කළ බැවින් කාර්යක්ෂමතා කඩඉම් සිදු කිරීම ප්‍රමාද විය. නමුත් මෙම කාර්යක්ෂමතා කඩඉම් 2023 මුල් කාර්තු 02 තුළ පැවැත්වීමට සියලු කටයුතු යොදා ඇත.

ගංගානි ලියනගේ
රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
118, දොස්තර බැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ - 08.